

වික්ටෝරියාහි පහසුවෙන් ගෙන යා හැකි දිගු සේවා ප්‍රතිලාභ යෝජනාක්‍රමය

# ඔබ සමඟ ගමන් කරන දිගු සේවා නිවාඩු.

ප්‍රජා සේවා | කොන්ත්‍රාත්තුගත පිරිසිදු කිරීම් | ආරක්ෂණ අංශය

plsa.vic.gov.au

Portable Long Service Authority

VICTORIA State Government

## පහසුවෙන් ගෙන යා හැකි දිගු සේවා නිවාඩුව යනු කුමක්ද?

මෙම යෝජනාක්‍රමය මගින් වික්ටෝරියාවේ ප්‍රජා සේවා, කොන්ත්‍රාත්තුගත පිරිසිදු කිරීමේ සහ ආරක්ෂණ කර්මාන්තවල සිටින සේවකයින්හට පහසුවෙන් ගෙන යා හැකි දිගු සේවා ප්‍රතිලාභ ලබා දේ. එක් සේවා යෝජකයකු සමඟ සිටින කාලය පමණක් නොව, කර්මාන්තය තුළ ගත කරනු ලබන සිය කාලය මත පදනම්ව දිගු සේවා නිවාඩු හිමිකම් වර්ධනය කර ගැනීමට සේවකයන්හට පුළුවන.

එය 'පහසුවෙන් ගෙන යා හැකි' වන්නේ සේවකයින් සේවා යෝජකයන් වෙනස් කළද එම කර්මාන්තය තුළදී ඒවා ඔවුන් සමඟ ඉදිරියට යන බැවිනි.

සේවකයන්ට එකම අවස්ථාවකදී සේවා යෝජකයන් ගණනාවක් සමඟ ලියාපදිංචි විය හැකිය. එකම කාලසීමාවක් තුළදී කිසියම් සේවකයෙකු එක් සේවා යෝජකයෙකුට වඩා වැඩි ගණනක් සඳහා සේවය කරන්නේ නම්, ඔවුනට එක් එක් සේවා යෝජකයා වෙතින් සමුච්චිත ප්‍රතිලාභ හිමි වේ.

## පහසුවෙන් ගෙන යා හැකි දිගු සේවා නිවාඩු ක්‍රියා කරනුයේ කෙසේද?

**ලියාපදිංචි වන්න**

සේවා යෝජකයන් විසින් සිය සේවකයින් යෝජනාක්‍රමය සඳහා ලියාපදිංචි කරන අතර ඔවුන්ගේ සේවකයන්හට ඊමේල් ආකාරයට හෝ තැපෑලෙන් පිළිගැනීමේ ලිපියක් එවනු ඇත.

**සමුච්චනය කර ගැනීම**

එක් එක් කාතර්තුවේදී, සේවා යෝජකයන් විසින් ඔවුන්ගේ සේවකයන්ගේ සේවා සහ වේතනයන් අප වෙත වාතර්ා කරන අතරම, මධ්‍යම අරමුදලකින් පාලනය කරනු ලබන ගාස්තුවක්ද ගෙවනු ලබයි.

**ප්‍රවේශය**

වාතර්ා කරන ලද සේවාවට වසර **7**කට පසුව, එම අරමුදලින් ගෙවනු ලබන දිගු සේවා ප්‍රතිලාභ සඳහා අයදුම් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා **enquiries@plsa.vic.gov.au** මගින් අප හා සම්බන්ධ වන්න එසේ නැතහොත් **1800 517 158** ඔස්සේ අප අමතන්න.